ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

අදියර I විභාගය - 2025 ජනවාරි

## (104) ව්‍යාපාරික පරිසරය

(Business Environment)

---

සම්පූර්ණ ප්‍රශ්න පත්‍රය මඟින් ව්‍යාපාර පරිසරය විෂයයේ අදියර I ට නිශ්චිතව දක්වා ඇති සියලුම ක්ෂේත්‍ර ආවරණය කර ඇති බැවින්, අයදුම්කරුවන්ගේ විෂය ක්ෂේත්‍රය පිළිබඳ සමස්ත දැනුම සහ අවබෝධය පරීක්ෂා කිරීම අරමුණ විය. සමස්තයක් වශයෙන්, බොහොමයක් අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සතුටුදායක වූ අතර, අනෙක් අය හොඳින් පිළිතුරු දීමට අපොහොසත් වී තිබුණි. අයදුම්කරුවන් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා ඇති ආකාරය නිරීක්ෂණය කිරීමෙන්, ප්‍රශ්න තේරුම් ගැනීමේදී සහ ප්‍රමාණවත් ලකුණු ලබා ගැනීමේදී ඇතිවූ ගැටළු වළක්වා ගැනීම සඳහා වැදගත් කරුණු පහත දක්වා ඇත:

## <u>A කොටස</u>

### ප්‍රශ්න අංක 01

ව්‍යාපාර පරිසරය විෂයයේ සමස්ත ක්ෂේත්‍ර ආවරණය කර ඇති අතර සියලුම අයදුම්කරුවන් පාහේ ප්‍රශ්නයට උත්තර ලිවීමට උත්සාහ කර සාර්ථකව උත්තර සපයා තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් **1.2, 1.5, 1.8, 1.13** සහ **1.16** යන ප්‍රශ්නවලට සාර්ථකව උත්තර සපයා නොමැත. එම ප්‍රශ්න සම්බන්ධයෙන් නිරීක්ෂණ පහත පරිදි වේ:

**1.2** අයදුම්කරුවන්ගෙන් බහුතරයක් "සීමාසහිත පෞද්ගලික සමාගමක අවම අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව" පිළිබඳව නිසි ලෙස දැන නොසිටි අතර බහුතරයක් වැරදි උත්තර තෝරාගෙන තිබුණි. නමුත් සාමාන්‍ය අයදුම්කරුවන් සංඛ්‍යාවක් (1) නිවැරදි උත්තරය ලෙස ලබා දීමෙන් සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි.

**1.5** බොහොමයක් අයදුම්කරුවන් ප්‍රශ්නය "තත්කාලීන දළ පියවීම් පද්ධතියේ සහභාගිකරු" නොවන බව නිවැරදිව හඳුනාගෙන නොතිබුණි. බොහොමයක් අයදුම්කරුවන් නිවැරදි උත්තරය (1) වෙනුවට (4) වන උත්තරය සළකුණු කර තිබුණි.

**1.8** බොහොමයක් අයදුම්කරුවන් රක්ෂණ ආවරණයක් ලබා ගැනීමෙන් පුද්ගලයෙකුට රක්ෂණය කළ හැකි දේ හඳුනාගෙන නොතිබුණි. අයදුම්කරුවන්ගෙන් සාමාන්‍ය සංඛ්‍යාවක් "ණයගැතියෙකුගෙන් ලැබිය යුතු මුදල් නොලැබීයාමේ අවදානම" තෝරාගෙන මෙම ප්‍රශ්නයට නිවැරදිව උත්තර ලබාදී තිබුණි.

**1.13** බොහොමයක් අයදුම්කරුවන් මුදල් වෙළෙඳපොළ, ප්‍රාථමික වෙළඳපොළ සහ ද්විතීයික වෙළෙඳපොළ ලෙස බෙදිය හැකි බව හඳුනාගෙන නොතිබුණි. එබැවින්, අයදුම්කරුවන් මුදල් වෙළෙඳපොළේ මූලික සංකල්ප සහ අංශ පිළිබඳ ඔවුන්ගේ දැනුම වැඩි දියුණු කරගත යුතුය. සාමාන්‍ය අයදුම්කරුවන් සංඛ්‍යාවක් සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි.

**1.16** සාමාන්‍ය අයදුම්කරුවන් සංඛ්‍යාවක් ව්‍යවසායකත්වයේ නව ප්‍රවණතා දෙකක් හඳුනාගෙන ලකුණු ලබාගෙන තිබුණි.

කෙසේවෙතත්, ඉහත ප්‍රශ්න හැර, බොහොමයක් අයදුම්කරුවන් මෙම කොටසට හොඳින් පිළිතුරු සපයා තිබුණි.

**සමස්තයක් වශයෙන්, මෙම ප්‍රශ්නය සඳහා කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## B කොටස

මෙම කොටස අනිවාර්ය ප්‍රශ්න හතරකින් සමන්විත විය. සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් ලබා දී තිබුණි.

## ප්‍රශ්න අංක 02

"කේවලස්වාමි ව්‍යාපාරයක" සහ "සීමාසහිත පෞද්ගලික සමාගමක්" පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම අපේක්ෂා කරන ලදී.

**(a)** කේවලස්වාමි ව්‍යාපාරයක අවාසි සාර්ථකව පැහැදිලි කිරීමෙන් අයදුම්කරුවන්ගෙන් බහුතරයක් මෙම කොටස සඳහා සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි. අවාසි වෙනුවට කේවලස්වාමි ව්‍යාපාරයක වාසි ලියා ඇත්තේ අයදුම්කරුවන් ස්වල්ප දෙනෙකු බව දක්නට ලැබුණි.

**(b)** සීමාසිහිත පෞද්ගලික සමාගමක් සංස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය ලියවිලි පරීක්ෂා කරන ලදී. සාමාන්‍ය අයදුම්කරුවන් සංඛ්‍යාවක් මෙම ප්‍රශ්නයට සාර්ථකව උත්තර දී තිබුණි. සමහර අයදුම්කරුවන් ලේඛණ හඳුනාගෙන නොතිබූ අතර ඔවුන් කොටස් හිමියන්ගේ ලැයිස්තුව, ණයවර ලිපිය, බැංකු ස්ථාවර නියෝග සහ පළාත් පාලන ආයතනවල සහතික කිරීම ලියා තිබුණි.

**(c)** බොහොමයක් අයදුම්කරුවන් සීමාසහිත පෞද්ගලික සමාගමක ලක්ෂණ සාර්ථකව පැහැදිලි කර තිබුණි.

**සමස්තයක් වශයෙන්, මෙම ප්‍රශ්නය සඳහා කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 03

ව්‍යාපාර උපකාරක සේවා පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම අපේක්ෂා කරන ලදී.

**(a)** බොහොමයක් අයදුම්කරුවන් "විනිමය මාධ්‍යයක් වීම" යන යෙදුම නිසි ලෙස පැහැදිලි කර ඇති අතර සම්පූර්ණ ලකුණු ලබා ගෙන තිබුණි.

**(b)** බොහොමයක් අයදුම්කරුවන් ජංගම ගිණුම්, ඉතිරිකිරීමේ ගිණුම්, ස්ථාවර තැන්පතු සහ කාලින තැන්පතු ලෙස වාණිජ බැංකුවල ව්‍යාපාරයකට පවත්වාගෙන යා හැකි ගිණුම් වර්ග ලියා තිබුණි. එසේම, සමහර අයදුම්කරුවන් තම සාමාන්‍ය දැනුම භාවිතා කර උත්තර දී සම්පූර්ණ ලකුණු ලබා ගෙන තිබුණි.

**(c)** ව්‍යාපාර ගනුදෙනු සිදු කිරීමේදී, මුදල්වලට වඩා චෙක්පත් භාවිතා කිරීමේ වාසි සඳහන් කිරීමට මෙම කොටසින් අපේක්ෂා කරන ලදී. අයදුම්කරුවන්ගෙන් බහුතරයක් තම සාමාන්‍ය දැනුමෙන් උත්තර නිසි ලෙස පැහැදිලි කර සම්පූර්ණ ලකුණු ලබා ගෙන තිබුණි.

**සමස්තයක් වශයෙන්, මෙම ප්‍රශ්නය සඳහා කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 04

**(a)** ව්‍යාපාර සංවිධානයක් සඳහා ආචාරධර්ම සංග්‍රහයකින් ව්‍යාපාර ආයතනයක් විසින් බලාපොරොත්තු වන ප්‍රතිලාභ ලැයිස්තුගත කිරීම බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදිව උත්තර සපයා ඇත.

**(b)** සමාජ වගකීම ඉටු කර ගැනීම සඳහා සමාගමක් විසින් හඳුන්වා දිය යුතු උපාය මාර්ග මෙම කොටස මඟින් පරීක්ෂා කරන ලදී. බොහොමයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට නිසි ලෙස පිළිතුරු දී නොමැත. නමුත් වාර්තාකරණය, විනිවිදභාවය, වගවීම, සත්‍යාපනය කිරීමේ හැකියාව සහ සමාජ වගකීම් ඉලක්ක තීරණය කිරීම සඳහන් කළ සහ එම කරුණු පැහැදිලි කළ අය සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි.

**(c)** තිරසාර භාවිතයන් භාවිතා මගින් අත්වන ප්‍රතිලාභ ප්‍රකාශ කිරීම පරීක්ෂා කරන ලදී. සාමාන්‍ය අයදුම්කරුවන් සංඛ්‍යාවක් සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි. සමහරු තිරසාර භාවිතයන්හි පාරිසරික ආශ්‍රිත ප්‍රතිලාභ පමණක් ලියා තිබුණි.

**සමස්තයක් ලෙස, මෙම ප්‍රශ්නය සඳහා කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 05

**(a)** බොහොමයක් අයදුම්කරුවන් විදේශ වෙළඳාමේ භාවිතා වන ප්‍රධාන ලියවිලි ලෙස නෞභාරපත, ණයවර ලිපිය, වාණිජ ඉන්වොයිසිය, කාර්ය සාධන ඉන්වොයිසිය (Performa Invoice), ප්‍රභව සහතිකය, රක්ෂණ සහතිකය සහ සනීපාරක්ෂක සහතික යනාදිය නිසි ලෙස පැහැදිලි කර සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි.

**(b)** නූතන ලෝකයට අනුකූලව ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික වෙළෙඳ ක්‍රියාකරකම් තුළ අනුගමනය කළ යුතු නව ප්‍රවණතා පැහැදිලි කිරීම අවශ්‍ය විය. බොහොමයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට නිසි ලෙස පිළිතුරු දී සාමාන්‍යයට වඩා ඉහළ මට්ටමක ලකුණු ලබාගෙන තිබුණි. සමහරු ප්‍රශ්නයට පිළිතුරු දී තිබුණත් නිසි ලෙස පැහැදිලි කර නොතිබුණි.

**(c)** බොහොමයක් අයදුම්කරුවන් විද්‍යුත් වාණිජ්‍යය භාවිත කිරීමෙන් පාරිභෝගිකයින් හට අත්වන වාසි ප්‍රකාශ කර සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි.

**සමස්තයක් ලෙස, මෙම ප්‍රශ්නය සඳහා කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## C කොටස

## ප්‍රශ්න අංක 06

මෙය Arial Textiles සම්බන්ධයෙන් සිද්ධි අධ්‍යයනය පදනම් කරගත් ප්‍රශ්නයකි. සියලුම අයදුම්කරුවන්ම පාහේ මෙම ප්‍රශ්නයට උත්තර ලිවීමට උත්සාහ කර ඇති අතර, ඔවුන්ගෙන් බහුතරයක් සාමාන්‍යයට වඩා ලකුණු ලබාගෙන තිබුණි.

**(a)** අයදුම්කරුවන්ගෙන් බහුතරයක් සීමාසහිත පොදු සමාගමක වාසි ලියා සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි. අයදුම්කරුවන් ඉතා ස්වල්ප දෙනෙකුට ප්‍රශ්නය පිළිබඳ දැනුමක් නොමැතිකම සහ නිසි අවබෝධයක් නොමැතිකම හේතුවෙන් ලකුණු ලබාගෙන නොතිබුණි. සමහර අයදුම්කරුවන් සීමාසහිත පොදු සීමිත සමාගමක් වෙනුවට හවුල් ව්‍යාපාරයේ සහ කේවළස්වාමි ව්‍යාපාරවල වාසි ලියා ඇති බව දක්නට ලැබුණි.

**(b)** අයදුම්කරුවන්ගෙන් බහුතරයක් ශදුඅත (SWOT) විශ්ලේෂණය භාවිතා කරමින් Arial Textiles හි ව්‍යාපාරික පරිසරය තක්සේරු කර සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි.

**(c)** ප්‍රශ්නයේ මෙම කොටසින් ව්‍යාපාරයක් සඳහා හොඳ ප්‍රවාහන ක්‍රමයක් තෝරාගැනීමේදී සලකා බැලිය යුතු තීරණාත්මක සාධක පරීක්ෂා කරන ලදී. බොහොමයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට හොඳින් පිළිතුරු දී සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි. ඔවුන්ගෙන් ස්වල්ප දෙනෙකුට ප්‍රශ්නය වරදවා වටහා ගැනීම නිසා සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට නොහැකි වූ අතර සමහර අයදුම්කරුවන් ලොරි, දුම්රිය සහ නැව් වැනි ප්‍රවාහන මාධ්‍ය උත්තර ලෙස ලබා දී තිබුණි.

**(d)** හොඳ ප්‍රවාහන පද්ධතියක් Arial Textiles හට උපකාර කරන ආකාරය මෙම කොටසින් පරීක්ෂා කරන ලදී. අයදුම්කරුවන්ගෙන් බහුතරයක් මෙම කොටස නිසි ලෙස පැහැදිලි කර තිබූ අතර, අනෙක් අයදුම්කරුවන් නිසි ලෙස පැහැදිලි කර නොතිබුණි.

**(e)** මෙම ප්‍රශ්නය ව්‍යවසායකයෙකු ලෙස ඒරියල් ටෙක්ස්ටයිල්ස් ආයතනයට අවශ්‍ය ව්‍යවසායකත්ව කුසලතා පරීක්ෂා කරන ලදී. සාමාන්‍ය අයදුම්කරුවන් සංඛ්‍යාවක් දී ඇති අවස්ථාවට අදාළ පිළිතුරු ප්‍රකාශ කර සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි. අනෙක් අය ඔවුන්ගේ සාමාන්‍ය දැනුමෙන් ලකුණු ලබා ගත්හ. ඉතා සුළු අයදුම්කරුවන් සංඛ්‍යාවක් ව්‍යවසායකත්වයේ ලක්ෂණ ලියා තිබුණි. පිළිතුරු දීමට පෙර සිද්ධිය හොඳින් කියවා තේරුම් ගැනීම අත්‍යාවශ්‍ය වේ.

**සමස්තයක් වශයෙන්, මෙම ප්‍රශ්නය සඳහා කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

- - -

**අයදුම්කරුවන්ගේ අවබෝධ කර ගැනීමේ මට්ටම සහ කාර්යසාධනය වැඩිදියුණු කර ගැනීම සඳහා සැළකිල්ලට ගතයුතු පොදු කරුණු:**

(1) ප්‍රශ්ණ පත්‍රය ලැබුණු පසු එහි දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවීම. (ඒ සඳහා අමතර කියවීමේ කාලය ප්‍රයෝජනයට ගත හැක).

(2) AAT විෂය නිර්දේශය/පාඩම් මාලාව මුළුමනින්ම අධ්‍යනය කිරීම.

(3) අයදුම්කරුවන් අවධානයෙන් ප්‍රශ්නය කීප වතාවක් කියවා, ලිවිය යුත්තේ කුමක්ද යන්න අවබෝධ කරගත යුතුය. ප්‍රශ්නය සඳහා ඍජු කෙටි උත්තර අපේක්ෂා කර තිබෙන විට අනවශ්‍ය පැහැදිලි කිරීම් සහ විස්තර නොලිවිය යුතුය.

(4) විභාගයේදී කාර්යක්ෂම ලෙස කාලය කළමණාකරණය කරගත යුතුය.

(5) පිළිතුරු සැපයීම එක් භාෂාවකින් පමණක් විය යුතුය. එය විභාගය සඳහා අයදුම් කල භාෂාවයි. සෑම නව ප්‍රශ්නයක් සඳහාම පිළිතුරු සැපයීම ආරම්භ කලයුත්තේ පිළිතුරු පොතේ අළුත් පිටුවකය. අත් අකුරු කියවිය හැකි මට්ටමක තිබීම හා උත්තර වලට ප්‍රශ්න අංක නිසිලෙස යොදා තිබිම ගැන සැළකිලිමත් විය යුතුය.

(6) උත්තර පත බාරදීමට පෙර සෑම පිටුවකම ප්‍රශ්න අංක සහ විභාග අංකය නිවැරදිව ලියා තිබේදැයි දෙවරක් පරීක්ෂා කරන්න.

(7) "කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව" ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහිදි දී ඇති අර්ථකථනවලට අනුකූල වෙමින් උත්තර ලියන්න.

(8) දැනුම වැඩිදියුණු කරගැනීමට, පසුගිය විභාගවල ප්‍රශ්න පත්‍ර අධ්‍යයනය කර උත්තර ලියා පුහුණු විය යුතුය.

(9) ඒ්ඒටි ආයතනය මඟින් නිකුත් කරන ස්ව-අධ්‍යයන පාඩම්මාලා (Self-study Text) පොත්, යෝජිත උත්තර, ලිපි, සඟරා ආදිය කියවීම අනිවාර්යයෙන්ම කළ යුතුය.

(10) කිසිදු ප්‍රශ්නයක් මගහැරීම නොකලයුතුය. මෙම පුරුද්ද විභාගය අසමත් වීමට හේතුවක් විය හැක.

(11) හොඳ සූදානමකින් සහ විභාගය සමත්වීමේ පරම චේතනාව පෙරටුකොටෙගන විභාගයට මුහුණ දීය යුතුය.

- * * * -